චක්‍රලේඛ අංක : 25/96

මගේ අංකය:- දපස/නීති/චක්‍ර,
දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන්
-සභාව,
අංක 07, බාලදක්ෂ මාවත,
ගාල්ල. 1996.ජූලි මස..31....දින දිය.

දකුණු පළාතේ සියළුම සමුපකාර සමිතිවල,
සභාපතිවරුන් වෙත.

දරු ප්‍රසූතියට පෙර ප්‍රමාද වී පැමිණිම සහ සේවා කාලයට
පෙර පිටව යාමට අවසර දීම.
===========================================

සමුපකාර සේවයේ නියුක්ත සේවිකාවන් විවාහයෙන් පසුව ගර්භනී අවස්ථාවට පත් වූ විට ඔවුන්ට සහන කාල සීමාවක් තුල ප්‍රමාද වී සේවා ස්ථානයට පැමිණීමට අවසර දීමටත්, සේවා කාලය අවසන් වීමට පෙර පිටව යාමට අවසර දීමටත්, කොමිෂන් සභාව තිරණය කර ඇත.

I. සේවිකාව ගර්භනී අවස්ථාව මාස 05 ක් වූ පසු රාජකාරි සඳහා සේවා ස්ථානයට පැය භාගයක් ප්‍රමාද වී පැමිණීමටද, සේවය අවසන් වන වේලාවට පෙර පැය භාගයකට ප්‍රථම පිට වී යාමටද, ඉඩ දිය යුතුය. මෙම අනුග්‍රහය දෙනු ලබන්නේ සේවිකාව ප්‍රසූත නිවාඩු ලබා ගන්නා තෙක් පමණි.

II. ප්‍රසූත නිවාඩුව අවසන් වීමෙන් අනතුරුව, තම දරුවාට මව් කිරි දීම සඳහා සේවය අවසන් වන වේලාවට පැයකට ප්‍රථම සේවා ස්ථානයෙන් පිටත්ව යාමටද, අවසර දිය යුතුය. මෙම අවසරය දිය යුත්තේ දරුවාගේ වයස මාස පහක් සම්පූර්ණ වන තුරු පමණි.

(සුමතිපාල වාගලවත්ත),
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත්:- 1. ලේකම්, - ආහාර හා සමුපකාර අමාත්‍යාංශය. (දැ.ප.)
2. ස.සං.කො./රෙ.- (දැ.ප.)
3. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු.
4. දකුණු පළාතේ සියළුම සමුපකාර සංවර්ධක නි.කොමසාරිස්වරු./ප්‍රා.ලේකම්වරු.

දේ/28.